
# වැරදුනු මුව දඩයම



ආර්.එම්.මෙතුලි මෝක්ෂා දිසානායක

# වැරදුනු මුව දඩයම

ආර්.එම් මෙතුලි මෝක්ෂා දිසානායක

කතා

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විද්‍යාලය

2 ශ්‍රේණිය B

2026. 05. 10

ISBN: 9786242113708

**පිදුම**

අම්මාටත් තාත්තාටත් මල්ලීටත්

පන්තිභාර ගුරුතුමියටත්

ආදරයෙන්

මේ පොත් පිංච පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10




# වැරදුනු මුව දඩයම

එකමත් එක කාලෙක විශාල කොටියෙක් සිටියා. මේ කොටි රාළ හරිම නපුරුයි. කැලේ ඉන්න අනෙක් සතුන් හැමෝට ම හිංසා කරනවා. ඒ නිසා මේ කොටි රාළගේ හඬ ඇහෙන කොටම කැලේ සත්තු ගස් කොළන් යට හැංගුණා.

දවසක් කොටියට තදින් බඩගින්නක් දැනුණා.

“අද නම් කැලේ පුරා ඇවිදලා හරි හොඳ දඩයමක් හොයා ගන්න ඕනෑ”

තමන්ට ම කියා ගත්තා. කොටියා මහ හඬින් ගොරවා කැලේ පුරා ඇවිදින්න පටන් ගත්තා.



කෑම සොයා ගෙන කොටි රාළ ගොඩක් දුර

කැලේ අවිදගෙන ගියා.කොටියට

වෙහෙසක් දැනුණා. එතකොටම වාගේ

ඌට මස් කෑල්ලක් දකින්න ලැබුණා.

“විවේකයක්වත් ගන්නේ නැතුව


අමාරුවෙන් හොයා ගත්ත මස් කෑල්ල.

මේක නම් කවුරු හරි කාලා ඉතිරි කරලා

ගිය මස් කෑල්ලක් වගේ.

ඒත් මේක රස පාටයි නේ”






මස් කෑල්ලේ රස බැලුවත් කොටි රාළගේ හිත නම් පිරුණේ නෑ.

තවත් එයාට බඩගිනි වැඩි වුණා.

“ අද නම් මේ වගේම රස මස් කන්න දඩයමක් කර ගන්න ඕනෙම යි” කොටි රාළ සිතා ගත්තා. ආයෙත් කැලේ පුරා ඇවිදින්න පටන් ගත්තා.



ඇත්තටම කොටි රාළට ටිකක් දුර යන කොට දිය බොමින් සිටි මුව රංචුවක් දකින්න ලැබුණා.

ඌට හරිම සතුටු හිතුණා.


කොටි රාළගේ කටට කෙළ ඉනුවා.

කොටියා මුවෙකු දඩයම් කිරීමට කුරුමානම් ඇල්ලුවා.

වෙලාව බලා කොටියා මුව රංචුව සිටි තැනට වේගයෙන් පැන්නා.

මරණ බයින් මුව රංචුවත් වේගයෙන් පැන දුවන්න පටන් ගත්තා.

ඒත් එක පුංචි මුව පැටියෙක් කකුල පැටලිලා කොටි රාළට හසු වුණා.






මුව පැටියා ගොඩක් බය වෙලා අඬන්න පටන් ගත්තා. එතකොට ම ගහක් යට සැග වී සිටි තව කොටියෙක්

ඒ තැනට මහ හඬින් ගොරවා පැන්නා.

කොටි රාළට වගේ ම මුව පැටියටත් වුණු දෙය හිතා ගන්න බැරි වුණා.

මුව පැටියා තවත් බියට පත් වුණා.

දැන් කොටියෝ දෙන්නම වාද කරන්න පටන් ගත්තා.



“මමයි මුව රංචුව මැදට පැන මුවා දඩයම් කර ගත්තේ” කොටි රාළ කීවා.


“නෑ මමයි සැහෙන වෙලාවක ඉදන් මේ මුව රංචුව දඩයම් කරන්න වෙලාව එනකල් අර ගහ යට හැංගිලා හිටියේ”

අනෙක් කොටියා කීවා

“ඒත් මමයි මුලින් පැන්නේ” කොටි රාළ ආයෙමත් කීවා.

“නෑ මමයි මේ මුවෝ කලින් දැක්කේ”

දෙන්නා ලොකු වාදයක් පටන් ගත්තා.



මුව පැටියා අල්ලා ගත් බව කොටි රාළලාට

අමතකව ගියා.

මේ වාදය නිසා මුව පැටියාගේ පැටලුණු

කකුලේ වේදනාව අඩු වුණා.

මුව පැටියා ශබ්ධ නොඇසෙන සේ හිමින්

එතනින් පැනලා ගියා.

වාදය මැද කොටි රාළ වටපිට බැලුවා. මුව

පැටියා පේන තෙක් මානෙකවත් හිටියේ

නෑ.

කොටි රාළලාට නිකරුණේ වාද කරන්නට

ගිය නිසා මුව දඩයම වැරදුණු බව

තේරුණා.

**උපදේශය : නිකරුණේ වාද කිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් නැත.**



**පසුවදන**

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවරිධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ''හේමමාලා උපහාර'' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.